# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1939/35 - 2015 නොවැම්බර් මස 06 වැනි සිකුරාදා - 2015.11.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත

15(1) වගන්තිය යටතේ නියමය

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15(1) වගන්තිය යටතේ, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, මෙම නියමයෙන් මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති වීරකැටිය ප්‍රාදේශීය සභාවට අයත් වලස්මුල්ල බස් නැවතුම්පොල සහ පැරණි වෙළඳ සංකීර්ණය පිහිටි ඉඩම 2015 නොවැම්බර් මස 02 දින සිට නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරමි.

පාඨලී චම්පික රණවක,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2015 නොවැම්බර් මස 02 වැනි දින,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
3 වන මහල,
''සෙත්සිරිපාය'',
බත්තරමුල්ල.

#### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, උතුරු ගිරුවා පත්තුවේ, වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලස්මුල්ල ගමෙහි පිහිටි (අ. ග. පි. 163) ගාලබැදිහේන නැමැති (වලස්මුල්ල බස් නැවතුම්පොල සහ පැරණි වෙළඳ සංකීර්ණය පිහිටි) ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු හා උසාවි කොමසාරිස් ටී. එච්. ජීවානන්ද මහතා විසින් පිළියෙල කර ඇති අංක 2008/040 හා 2008.05.23 දිනැති සැලැස්මේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 0, රූඩ්. 3, පර්. 15.8ක් වූ ඉඩම් කොටස.

ඉඩමේ මායිම් පහත පරිදි වේ :

| | | |
|---|---|---|
| උතුර | : | ස්ථිර ගොඩනැගිලි ; |
| නැගෙනහිර | : | ස්ථිර ගොඩනැගිලි ; |
| දකුණ | : | වීරකැටිය දක්වා මහා මාර්ගය ; |
| බටහිර | : | බෙලිඅත්ත සිට මිද්දෙනිය දක්වා මහා මාර්ගය. |

11-634

1A - G 22570— 08 (2015/11)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.